ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (ස්වාභාවික විද්‍යා) උපාධිය - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2008

අධ්‍යාපන මනෝ විද්‍යාව - **ESU 4106**

කාලය පැය තුනයි.

---

දිනය - 2008.08.29 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. 'කළමනාකරණය' යන සංකල්පය ඔබේ වචනවලින් කෙටියෙන් පැහැදිලි කරන්න.

02. පීටර් ඩ්‍රකර් හඳුන්වාදුන් කළමනාකරණ න්‍යායයේ අඩංගු ප්‍රධාන සංකල්පය කුමක් ද? එම න්‍යායෙහි ලා ඩ්‍රකර් සඳහන් කල, කළමනාකරුවා සතු භූමිකා අතුරින් තුනක් (03) නම් කරන්න.

03. 'සායනික අධීක්ෂණය' යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

04. අධ්‍යාපන කළමනාකරණය විමධ්‍යගත කිරීමෙහිලා 1984 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ගත් එක් වැදගත් පියවරක් සඳහන් කරන්න. එම පියවර ගැනීමට තුඩුදුන් හේතු සැකෙවින් දක්වන්න.

05. පාසල් කටයුතු සැලසුම් කිරීමේ වැදගත්කම සනාථ කිරීමට කරුණු පහක් (05) දක්වන්න.

06. "මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම විදුහල්පතිවරයෙකුට අත්‍යවශ්‍ය වේ." මෙම ප්‍රකාශයට ඔබ එකඟ ද? ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න.

07. විද්‍යා ගුරුවරයෙකු සතුවිය යුතු කළමනාකරණ කුසලතා තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

08. කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන් පාසල් අධීක්ෂණයේ යෙදෙන විට අවධානය යොමු කලයුතු අංශ පහක් (05) දක්වන්න.

## 2 වන කොටස

9. (i) පහත ඕනෑම ගැටළු දෙකක් ඔබ පාසලෙහි කළමනාකරණයට බලපෑම් කර ඇති ආකාරය පැහැදිලි කරන්න.

    (අ) පුහුණු ගුරුවරුන්ගේ හිඟය
    (ආ) ගුරුවරුන්ගේ සෘණාත්මක ආකල්ප
    (ඇ) මුදල් හා අනෙකුත් සම්පත්වල හිඟය

   (ii) එම ගැටළු දෙක මඟහරවා ගැනීම සඳහා ඔබගේ පාසල විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග දෙක බැගින් සාකච්ඡා කරන්න.

10. නොයෙක් කළමනාකරණ න්‍යායවාදීන් විවිධ කළමනාකරණ ශෛලීන් පිළිබඳව සැලකිලිමත් විය.

   (i) කළමනාකරණ ශෛලීන් දෙකක් (02) නම් කරන්න.
   (ii) රොබර්ට් බ්ලේක් සහ ජේන් මවුටන් ඉදිරිපත් කල කළමනාකරණ ග්‍රිතය විස්තර කරන්න.
   (iii) කළමනාකරණ ග්‍රිතයේ ඔබගේ පාසල් විදුහල්පතිවරයාට සුදුසු ස්ථානය තීරණය කොට ඒ සඳහා හේතු දක්වන්න.

11. (i) පාසලක් තුළ ඔබට දැක ගත හැකි විවිධාකාර අන්තර් පුද්ගල සම්බන්ධතා නිදසුන් දෙමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

   (ii) ඔබ සඳහන් කල ඕනෑම සබඳතා වර්ග දෙකක ප්‍රතිඵල උදාහරණ දක්වමින් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

12. "ශ්‍රී ලංකාව කුඩා රටක් වුවද එහි පාසල් අධ්‍යාපන පද්ධතිය ඉතා සංකීර්ණ වේ." මෙම ප්‍රකාශය විභාග කරන්න.

13. මැක්ස් වෙබර් සම්භාව්‍ය සංවිධාන න්‍යායවාදියෙකි.
   (i) ඔහුගේ න්‍යායය හඳුනාගෙන එහි ලක්ෂණ පැහැදිලි කරන්න.
   (ii) පහත සඳහන් දෑ කෙරෙහි වෙබර්ගේ අදහස් නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

    අ. සංවිධාන
    ආ. බලය
    ඇ. අධිකාරිත්වය

14. පහත සඳහන් ඕනෑම තුනක් (03) පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   i. ශ්‍රී ලංකා පාසල් පද්ධතියේ කළමනාකරුවන් සඳහා පුහුණු අවස්ථා
   ii. පාසලක කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව
   iii. පාසල් විද්‍යාගාරවල සම්පත් කළමනාකරණය
   iv. පන්ති කාමර කළමනාකරණය
   v. පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම හා සම්බන්ධ කළමනාකරණ මතවාද

- හිමිකම් ඇවිරිණි. -